# යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ බෞද්ධ මතය

# Buddhist Perspective on duty and Right

ආචාර්ය කුමාරි මදනායක

**Abstract**

Duty and rights can be compared to two sides of the same coin. Ethical behavior enhances social relationships and fosters a positive community. Societies may face significant challenges due to various backward qualities. Therefore, it is essential that we fulfill our duty while others exercise their rights. By doing so, we can build a better society. duty serves as the foundation of any community and can be categorized into three main areas: Economic, Political, and Social.

When everyone performs their duties and obligations, the rights of individuals are more likely to be realized. Sometimes, people strive to secure their own rights without fulfilling their corresponding duties. Buddhism teaches that fulfilling our duties enables us to secure our rights and affirm them within society. We should not blame others for societal issues if we have not met our own responsibilities. The Sigālovāda, Vyaggapajja, Kūtadantha, Pārābava, and Dhammika Suttas highlight our social, economic, and political obligations and duties, emphasizing the importance of these responsibilities in creating a harmonious society.

**Keywords:** buddhism, duty, rights, society

## හැඳින්වීම

බුදුදහම සමාජ පැවැත්ම සඳහා යුතුකම් සම්බන්ධතා පවත්වා ගැනීම විෂයයෙහි අත්‍යවශ්‍ය වූ සාධකයක් ලෙස පෙන්වා දේ. යුතුකම්, ඉටු කිරීම තමාගේ මෙන්ම අන්‍යන්ගේ ද පැවැත්ම රදා පවතින බවයි. යුතුකම් ඉටු කිරීම නිසාම අයිතිවාසිකම් ඉටු වන බවත්, අයිතිවාසිකම් ඉටු නොවීම තුළ සහයෝගීතාව අතික්‍රමණය වෙමින් ගැටුම් ඇති වීම දක්නට ලැබේ. එසේ නම් සහයෝගීතාව බිඳී යාමටත් සම්බන්ධතා බිඳිමටත් ගැටුම් ඇති වීමටත් හේතු වන්නේ යුතුකම් ඉටු නොවීම හෝ යුතුකම් ඉටු වීමේ අඩු වැඩි තත්ත්වය පදනම් කොට ගෙනයි. කරුණාව පදනම් කර ගනිමින් අනෙකා විෂයයෙහි යුතුකම් ඉටු කරන අතර පුද්ගලයා විසින් දේශපාලනික වශයෙන් ආර්ථික හා සාමාජියික වශයෙන් යුතුකම් ඉටු කිරීම තුළ සමාජය යහපත් වේ. විශේෂයෙන් සිඟාලෝවාද සූත්‍රයේ දී යුතුකම් පිළිබඳව සාකච්ඡා කර ඇති අතර අයිතිවාසිකම් හිමි වන පුද්ගලයා විසින් ද පෙරළා තම යුතුකම ඉටු කරන්නේ නම් අනෙක් පාර්ශවය උදෙසා ද යුතුකම් ඉටු වනු ඇත. ඒ අනුව එහිදි සමස්ත සමාජය කොටස් හයකට වර්ග කරමින් යුතුකම් ඉටු කළ යුත්තේ කෙසේ ද යන්නත් එවිට අයිතිවාසිකම් නිරායාසයෙන් හිමි වන ආකාරයත් මැනවින් දක්වා ඇත.

## පර්යේෂණයේ අරමුණ

අයිතිවාසිකම් දිනා ගැනිම විෂයයෙහි උත්සුක වීමට වඩා, තමා විසින් අනන්‍යයන් උදෙසා කළ යුතු යුතුකම් කෙරෙහි අවධානය යොමු කිරිමෙන් ගැටලු වළක්වා ගනිමින් යහපත් ජිවිතයක් ගත කළ හැකි බව අවධාරණය කිරිම.

## පර්යේෂණ ගැටලු

යුතුකම් ඉටු කිරීම තුළින් සමාජ සංස්ථාවන්හි උද්ගත වන ගැටලු අවම කර ගනිමින්, සදාචාර සම්පන්න සමාජයක් ගොඩනගා ගත හැකිද? යන්න මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ, ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය අධ්‍යයනය මෙම කරමින් පර්යේෂණය සිදු කරන ලදි.

**අර්ථ විවරණ**

ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයට අනුව යුතුකම් යන්න භාවිත ඉංග්‍රිසි පදය වන්නේ duty යන්නයි. ඒ අනුව සදාචාරාත්මක හෝ නීතිමය වගකීමක් යුතුකම් ලෙස අර්ථ දක්වයි. (duty is moral or legal obligation&. (Oxford Advanced Learner's Dictionary, 2005, 477p) අයිතිවාසිකම් යන්න එහි අර්ථ දක්වා ඇත්තේ රසටය යන පදයයි. යමක් කිරිමට ඇති සදාචාරාත්මක හෝ නෛතික අයිතිය. (a moral or legal entitlement to have or do something)

**සාකච්ඡාව**

යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ බෞද්ධ මතය සාකච්ඡා කිරිමේ දී ආර්ථික, දේශපාලන, සමාජයීය හා පුද්ගල වශයෙන් විවිධ පැති කඩ ඔස්සේ සාකච්ඡා කළ හැකිය. යුතුකම් පිළිබඳ සාකච්ඡාවේ දී ගිහි විනය ලෙස හැඳින්වෙන සිඟාලෝවාද සූත්‍රය වැදගත්වේ. කූටදන්ත, නකුලපිතු, ව්‍යග්ඝපජ්ජ, චක්කවත්ති, පත්තකම්ම, පරාභව, සීහනාද, ධම්මික සූත්‍රයන් වැදගත්වේ.

යුතුකම් හා අයිතිවාසිකම් තුළින් සමාජ සම්බන්ධතා යාවත්කාලීන වන අතර යහපත් ආර්ථික, දේශපාලන හා සමාජ තත්ත්වයක් ගොඩනගා ගත හැකිය. යුතුකම් ඉටු නොකිරීම අන් අයගේ අයිතිවාසිකම් අහිමි වීමට ප්‍රධාන හේතුවකි. යුතුකම් ඉටු නොකිරීම හා නොවීම තුළ අයිතිවාසිකම් අහිමි වේ. යුතුකම් සදාචාරාත්මක අංශය නියෝජනය කරන අතර අයිතිවාසිකම් නීතියම අංශය නියෝජනය කරයි.

බුදුන් වහන්සේ මාරයාට ප්‍රකාශ කළේ, තමන් වහන්සේ ආයු සංස්කාර අත් හැරීමට ප්‍රථමව, ඉටු කළ යුතු කාර්යයක් ලෙස දක්වන්නේ "තම ශ්‍රාවකයන් වහන්සේලා ව්‍යක්ත, විනීත, විශාරද තත්ත්වයට පත් වන තුරු පිරිනිවන් නොපාන බවයි." (අංගුත්තර නිකාය, 2008, 291පි) එමගින් තහවුරු වන්නේ යුතුකම් පිළිබඳ බුද්ධ දේශනාවේ පමණක් නොව බුද්ධ චරිතය තුළින් ද ඉස්මතු වන ආකාරයයි.

සිඟාලෝවාද සූත්‍රයේ දී යුතුකම් ඉටු කිරීමේ දී අනුකම්පති හා පච්චුප්පට්ඨානතබ්බා යන වචනයන් අවධාරණය කරන ලදි. (දීඝනිකාය, 2008, 306පි) එහි සඳහන් වන ආකාරයට අප විසින් කළ යුතු කාර්යයක් නොව, අනෙකා කෙරෙහි අනුකම්පාව පෙරදැරිව හා උපස්ථානය කිරිමේ අදහසින් යුක්තව කටයුතු කිරීම යුතුකම් වල පදනම බවයි.

සිඟාලෝවාද සූත්‍රයේ දී, සමස්ත සමාජයම කොටස් හයකට වර්ගීකරණය කොට, සියලුම සමාජ කණ්ඩායම් වලට ඔවුනොවුන් කළ යුතු යුතුකම් පෙන්වා දී ඇත. මව්පිය දූදරු(පෙරදිග දිශාව),ගුරු සිසු(දකුණු දිශාව), ස්වාමි භාර්යා(බටහිර දිශාව), හිත මිතුරු(උතුරු දිශාව), මහණ බමුණන්(උඩ දිශාව), සේව්‍ය, සේවක සබඳතා(යට දිශාව)ලෙස වර්ගීකරණය කළ හැකි වේ. (දීඝනිකාය, 2008, 308පි)

මව්පිය දූදරු සබඳතාවේ මව්පිය යුතුකම් වශයෙන් දක්වා ඇත්තේ, දරුවන් අයහපතෙන් මුදවා, යහපතෙහි යෙදවීම, මැනවින් ඉගැන්වීම, සුදුසු කළ අවාහවිවාහ කරදීම, මව්පියන් සතු දායාද පවරා දීම දෙමව්පියන් දරුවන් විෂයෙහි කළ යුතු යුතුකම් ලෙස පෙන්වා දේ. දරුවන් දෙමාපියන් විෂයෙහි ඉටු කළ යුතු යුතුකම් ලෙස, මවුපියන් පෝෂණය කිරීම, ඔවුන්ගේ කටයුතු සොයා බැලීම, කුල පරම්පරාව හා පරම්පරාගත චාරිත්‍ර වාරිත්‍ර ආරක්ෂා කිරීම, මවුපිය දායාද නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීම, මවුපියන් මිය ගිය පසු ඔවුන්ට පින් අනුමෝදන් කිරීම. (දීඝනිකාය, 2008, 304පි)

ඒ අනුව දෙමව්පියන්, දූ දරුවන් විෂයයෙහි ස්වකීය යුතුකම් ඉටු කරන්නේ නම් ගෘහස්ථ සමාජය තුළ දී දරුවන්ට

හිමි විය යුතු ආදරය, සෙනෙහස, කරුණාව නිතැතින් ම හිමි වේ. එවිට දරුවන් සමාජය තුළ අසරණ වීම, නොසැලකිල්ල, අපචාරයන්ට ගොදුරු වීම සිදු නොවනු ඇත. ගෘහස්ථ සමාජය තුළ ගැටළු අවම මට්ටමකට පත් වීමෙන් ආදරය, ඒකවරණය සපිරි ගෘහස්ථ සමාජයක් නිර්මාණය කර ගත හැකි වේ. දෙමාපියන්ට නිසි ලෙස කෘතවේදී වන දූදරුවන්ට ඔවුන්ගේ දූ දරුවන්ගේ කෘතවේදීත්වය ද නිතැතින්ම හිමිවේ. මේ අනුව පරම්පරා තුනක සම්බන්ධය, මාපිය දූදරු මුණුපුරු මිණිපිරි, පවුල වශයෙන් ගැනීමට සිඟාලෝවාද සූත්‍රය අනුබල දේ. (පඤ්ඤාරතන හිමි, ධම්මික හිමි, බෞද්ධ අධ්‍යයන විමර්ශනය, 496 පිටුව) බෞද්ධ මනෝ චිකිත්සාව මගින් පුද්ගල මානසිකත්වය සුවපත් කරලීමත්, යථාර්ථය තුළ ජීවත් වීමට මග පෙන්වීමත් සිදු කරන අතර ඒ සඳහා අවශ්‍ය ඉගැන්වීම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තුළින් එම ප්‍රතිඵල ලඟා කරගනිමින් සහජීවනයෙන් පිරි පවුල ද සමාජයක් නිර්මාණය කොට ගත හැකි වනු ඇත. ස්වාමි හා බිරිඳ පෙන්වා දි ඇත්තේ බටහිර දිශාවෙනි. ඒ අනුව බටහිර දිශාව සමෘද්ධිමත් කිරිමට නම් ගෘහස්ථ සමාජය සාර්ථක කර ගැනිමට උපස්ථම්භක වන යුතුකම් පෙන්වා දී ඇත. විවාහ ජිවිතය තුළ දී ස්වාමියා විසින් බිරිද සඳහා කළ යුතු යුතුකම් වශයෙන් දක්වා ඇත්තේ, ගරු කිරිම, අවමන් නොකිරීම, පරඹුවන් කරා නොයාම, නිවසේ කටයුතු පවරාදීම, වස්ත්‍රාභරණ සපයාදීමෙන් යුතුකම් ඉටු කළ යුතු බවයි. බිරිඳ විසින් ස්වාමියා සඳහා කළ යුතු යුතුකම් ලෙස, පිරිවර ජනයාට සංග්‍රහ කිරීම, පරපුරුෂ සේවනයේ නොයෙදීම, වස්තුව රැක ගැනීම සියලු කටයුතු අනලස්ව සිදු කිරීම වේ. මේ ආකාරයට ස්වාමියා හා භාර්යාව විසින් ඔවුනොවුන් සඳහා යුතුකම් ඉටු කිරීමෙන් දෙපාර්ශවයටම හිමි අයිතිවාසිකම් හිමිවේ. එමගින් ඔවුනොවුන් අතර සහයෝගය, ආදරය වැනි මානසික අවශ්‍යතා ඉටු වීම තුළ යහපත් කුල ගෙයක් නිර්මාණය වන අතරම සාර්ථක විවාහ ජිවිත ගත කිරිමට හැකියාව ලැබේ. සිගාලෝවාද සූත්‍රයේ දී බුදුරදුන් දෙසා වදාරන්නේ ස්වාමි පුරුෂයා භාර්යාවගේ අනුකම්පාවට ලක් විය යුතු බවය. ස්වාමි පුරුෂයා කළ යුත්තේ භාර්යාවට කෘතවේදීත්වය පළ කොට සිටීමය. (පඤ්ඤාරතන හිමි, ධම්මික හිමි, බෞද්ධ අධ්‍යයන විමර්ශනය, 497 පිටුව)

යුතුකම් හා අයිතිවාසිකම් හිමි වූ විට මානව අවශ්‍යතා සම්පූර්ණ වේ. බුදුදහම මිත්‍රත්වය බොහෝ සේ ඇගයීමට ලක් වන අතරම ශාසනය පවතින්නේ ද කල්‍යාණ මිත්‍රත්වය මත යන්න සඳහන්වේ. ඒ අනුව මිතුරන් විසින් කළ යුතු යුතුකම් දහයක් වේ. දානයෙන්, ප්‍රියවචනයෙන්, අර්ථචර්යාවෙන්, සමානාත්මතාවයෙන් හා නොරැවටීමෙන් යුතුකම් ඉටු කළ යුතුවේ. ඒ ආකාරයෙන් යුතුකම් ඉටු කරන මිත්‍රයා සඳහා මිතුරන් විසින් කළ යුතු යුතුකම් ලෙස දක්වන්නේ බියක් පැමිණි කල්හි පිහිට වෙයි. මිතුරාට අනුකම්පා කරයි. මත්ද්‍රව්‍ය පානයෙන් වළකයි, පමා වූ මිතුරාගේ වස්තුව රැක ගනියි, විපතේ දී අත් නොහරියි, ඔහුගේ දූ දරුවන් රැක ගනියි. මේ ආකාරයෙන් මිත්‍රයන් විසින් ඔවුනොවුන් කෙරෙහි යුතුකම් ඉටු කිරිමෙන් දෙපාර්ශවයේම අයිතිවාසිකම් සුරැකෙන අතර සමාජය ද යහපත් වනු ඇත.බඑහිදි ඇසුර සඳහා සුදුසු සේවනය කළ යුතු උපකාරක, සමානසුඛදුක්ඛ, අත්ථක්කායි, අනුකම්පක යන මිත්‍රයන් හතර දෙනෙකු පිළිබඳව සූත්‍ර පිටකයේ සඳහන්වේ. ඕනෑම සබඳතාවක් සුරක්ෂිතවීම කෙරෙහි යුතකම් හා අයිතිවාසිකම් බලපෑම් කරන බව පැහැදිලිවේ.

යුතුකම් පිළිබඳ සාකච්ඡාවේදී යුතුකම් ඉටු කළ යුතු අනෙකුත් සමාජ සංස්ථාව වන්නේ මහණ බමුණන්ය. මෛත්‍රී කාය කර්මයෙන්, මෛත්‍රී වචී කර්මයෙන්, මෛත්‍රී මනෝ කර්මයෙන් ද මහණ බමුණන් උදෙසා තම නිවස විවෘතව තැබීමෙන් හා ආමිසයෙන් සංග්‍රහ කිරිමෙන් යන යුතුකම් මහණ බමුණන් විෂයෙහි කළ යුතුවේ. මෙසේ යුතුකම් ඉටු කරන කුලපුත්‍රයාට අනුකම්පා කර පවින් වළකයි, කුසලයෙහි පිහිටුවයි, හොද හිතින් ආශිර්වාද කරයි, නොදත් දේ කියාදෙයි, දත් දේ පිරිසිදුව ප්‍රගුණ කරයි, විමුක්ති මාර්ගය පෙන්වා දෙයි. මහණ බමුණන් විසින් යුතුකම් ඉටු කරන විට සමස්ත සමාජයම සදාචාර සම්පන්න වේ. මහණ බමුණන්ට ආමිසය සැපයීම නම් ඔවුන්ගේ කුදුමහත් ඕනෑඑපාකම් සොයා බැලීමය. ආගම තරම් සංස්කෘතිය හා සබැදි තවත් සමාජ සංසිද්ධියක් නොමැති බැවින් ආගම රැක ගත හැක්කේ ඒ අන්දමට මහණබමුණන්ට සැලකීමෙනි. මහණබමුණන්ට ආරක්සාව සැපයීම රාජ්‍යයේ යුතුකමක් හැටියට දක්වා ඇත්තේ

ද මේ නිසා විය යුතුය. ආගමික වටිනාකමක් ඇති ස්ථානවලට ගරු කිරීමට ඒවායේ කෙරෙන පුද පූජා නොකඩවා පවත්වා ගෙන යෑමට සහ ඕවායේ නඩත්තු කටයුතු පවත්වා ගෙන යෑමට දිරි දරන මිනිසුන් වසන රටක් නොපිරිහෙන බවට බුදුරදුන් කරන ප්‍රකාශයය.(පඤ්ඤාරතන හිමි, ධම්මික හිමි, බෞද්ධ අධ්‍යයන විමර්ශනය, 511 පිටුව)

බලපරිදි වැඩ පැවරීමෙන් බත් වැටුප් දීමෙන් ගිලන් කල උවැටන් කිරීම, විශේෂ රස බොජුන් ආදිය බෙදා දීමෙන්, නිසි කල නිවාඩු දීමෙන්, පුද්ගලයාගේ කායික ශක්තිය අනුව වැඩ පැවරීම යනු ශක්තියයි. උගත්කම, පුහුණුව, පලපුරුද්ද, චරිත ශක්තිය, අවංකකම, පෞරුෂය යන ආදියම ගනී.(සමයෙ වොස්සග 'ගේන) වරින් වර නිදහස, විවේකය නොදීම, දවසේ වැඩ නියමිත වෙලාවට අවසන් නොකිරීම, ශ්‍රමය උපරිම ලෙස සූරා ගැනීම වෙයි. පළමුව අවදිවෙයි, පසුව නිදා ගනියි, දෙන දෙයක්ම ගනියි, කටයුතු සැලකිල්ලෙන් කරයි. මේ ආකාරයට සේවකයාට විසින් යුතුකම් ඉටු කරනු ලබයි. සේව්‍ය සේවක සම්බන්ධය පිළිබඳ සිගාලෝවාද සූත්‍රයේ එන උක්ත කරුණු වලින් හෙළි වන්නේ නීතිරීති රෙගුලාසි සහ අරගල වලින් දිනාගත නොහැකි සාමකාමී ප්‍රමෝදජනක වැඩපොළක් කර්මාන්ත ශාලාවක් සහ ආයතනයක් ගොඩනගා ගැනීමට අදාළ වන උපදෙස් මාලාවක් බුදුදහම නිර්දේශ කරයි.(පඤ්ඤාරතන හිමි, ධම්මික හිමි, බෞද්ධ අධ්‍යයන විමර්ශනය, 505පිටුව)

පන්සිල් සුරකීම තුළින් ද සිදු වන්නේ අයිතිවාසිකම් ආරක්ෂාවීමයි අප විසින් පන්සිල් ආරක්ෂා කරන විට අනෙකාගේ අයිතිවාසිකම් සුරක්ෂිතවේ. එමෙන්ම චක්‍රව තමාගේ ජීවිත සුරක්ෂිතතාව ඇතිවේ. තමාගේ ක්‍රියාව හේතුවෙන් ම අනුන් පමණක් නොව තමන් ද සුරක්ෂිතවේ. තමන් විසින් පණ ඇති සතුන් නොමැරීම මත ඔවුන්ගේ ජිවිත සුරක්ෂිතතාව මෙන්ම තමාගේද ජිවිත සුරක්ෂිතතාව ඇතිවේ.

දෙවන සිල්පදය තුළ දක්වන්නේ තමාට අයිති නැති දේවල් සොර සිතින් නොගත යුතු බවයි එහිදි පෙන්වා දෙන ආකාරයට තමාගේ වස්තුව දේපල ආරක්ෂා කර ගැනීමට නම් තමාද අන් අයගේ වස්තුව දේපළ සොරකම් කිරිමෙන් වැළකිය යුතු බවයි මෙම පංචශිලය තුළින් ද වක්‍රාකාරව පිළිඹිබු වන්නේ යුතුකම් හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳවයි තමා විසින් පංචශිලය ආරක්ෂා කරමින් සිල්වත් ජීවිතයක් ගත කරන විට දී අන් අය හා සමාජය විසින් ද සිල්වත් ජීවිතයක් ගත කිරීම උදෙසා අවශ්‍ය වන පසුබිම සකස් කරමින් යුතුකම් ඉටු කරන විට, තමාගේ අයිතිවාසිකම් නිතැතින්ම හිමිවේ. පඤ්චකාම ගුණයන් නිසා උපදනා යම් සුව සොම්නසක් වේද එය කාමාස්වාදයයි කාමයේ ආස්වාදය හේතුවෙන් සියලු තත්ත්වයන් මූලාවට පත් වී අය උතුම් සැපයක් සේ සිතා පසිඳුරන් පිනවීමට කටයුතු කරයි. ඒ සඳහා තම සියලු ධනය ද වියදම් කරන අතර එමඟින් බෝහෝ දුෂ්කරතාවන්ට ද පත්වේ.

නූතන සමාජයේ දිනෙන් දින වර්ධනය වන සමාජ අපචාර හා බිදවැටිම් අධ්‍යනය කරන විට අපට පැහැදිලිවන්නේ එවැනි ව්‍යාකුල සමාජ තත්ත්වයන් ගොඩනැගෙන්නට ප්‍රාණඝාතය, සොරකම, වැරදි ලිංගික ක්‍රියා, බොරුකීම, මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය වැඩිවීම යන ක්‍රියා ඒ සඳහා පදනම වීඇති ආකාරයයි. පඤ්ච ශිලයට ඇතුළත් මෙම අත්හල යුතු ක්‍රියාවලින් පුද්ගලයා බැහැර නොවීම හා සමාජයේ බහුතරයක් දෙනා එම පාපී ක්‍රියා තම ජීවන අවශ්‍යතා ඉටු කර ගැනිමේ උපාය මාර්ග බවට පත් කර ගැනීමට යාමෙන් නූතන සමාජ වල ගැටලු ඇති වීමට මූලික පදනම වී තිබේ. ඕනෑම සමාජයක යහපැවැත්ම ඇති කර ගැනීමට නම් අන් කවර පාලනයකටත් පෙර පන්සිල් මඟින් ඇති කර හික්මීම ඇති කර ගත යුතුය. (ඤාණරතන හිමි, සම්භාෂා, 271 පිටුව)

## දේශපාලනික යුතුකම් හා අයිතිවාසිකම්

දීඝනිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයෙහ් "ධම්මිකො ධම්මරාජා අදණ්ඩෙන අසත්ථෙන" යනුවෙන් අවධාරණය කරයි. සුමංගල විලාසිනියට අනුව යුක්ති සහගත, අපක්ෂපාතිත්වයෙන් (සමෙන) (දීඝනිකාය, 2018, 130 පි) යුතුව රාජ්‍ය පාලනය කළ යුතු බව දක්වයි. දල්හනේමි රජ තම පුතුට බලය දී, ටික කලකින් චක්‍ර රත්නය අතුරුදහන් විය. ඒ පිළිබඳ පිය රජුගෙන් විමසූ විට දැන ගන්නට ලැබුණේ සක්විති වත් ප්‍රගුණ කරන විට පමණක් චක්‍ර රත්නය පහළ වන බවයි. එයින් පැහැදිලි වන්නේ පාලකයාගේ යුතුකම වන්නේ දැහැමිව රාජ්‍ය පාලනය කිරීමයි. අග්ගඤ්ඤ සූත්‍රය තුළ දී ද ජනතාව විසින් රජෙකු තෝරා පත් කර ගන්නේ ධර්මානුකූලව පාලනයක් සඳහා බවයි. (ධම්මේන පරෙ රඤ්ජතීති රාජා)(දීඝනිකාය, 2008, 158පි)

චක්කවත්ති සීහනාද සූත්‍රයේ දී දස සක්විති වත් තුළින් පෙන්වා දෙන්නේ පරමාදර්ශී පාලනයක් උදෙසාය. ((දීඝනිකාය, 2008, 104පි) එහිදි රාජ්‍ය පාලකයා විසින් පාලිතයන් උදෙසා කළ යුතු යුතුකම්ය. පාලකයා විසින් පළමුවෙන්ම අඹු දරුවන් ඇතුළු සියලු දෙනා ආරක්ෂා කළ යුතු වේ. දෙවනුව තමා ඇතුළු රට වැසියන් ගේ ආරක්ෂාව සලසන පිරිස(ආරක්ෂක බලකාය) ආරක්ෂා කළ යුතු බව දක්වයි. එහිදි ආහාර වස්ත්‍ර ආදිය දීමෙන් ද තම යුතුකම් ඉටු කරන ආකාරය පෙන්වා දෙයි. රටක ආර්ථිකය සදාචාරය ආදි සියල්ලම රදා පවතින්නේ පාලකයාගේ චර්යාව මතය. රජු ධාර්මිකව රාජ්‍ය පාලනය කරමින් යුතුකම් ඉටු කරන්නේ නම්, පාලිතයා ගේ අයිතිවාසිකම් ආරක්ෂාවීම තුළ ඔවුන් විසින් රජයට අයවිය යුතු අයබදු ගෙවමින්, ධාර්මිකව ඳ කියාවේ නිරත වෙමින් පාලකයාට දැහැමි පාලනයක් ගොඩනගා ගැනීම විෂයෙහි අවශ්‍ය යුතුකම් ඉටු කරයි. එවිට රජයට ඉටු විය යුතු යුතුකම් ඉටුවීම තුළ රාජ්‍යය තුළ ගැටුම් හෝ අර්බුදකාරී තත්ත්වයන් උද්ගත නොවීම තුළ පාලකයා හා පාලිතයා සුඛිත මුදිත වේ.

ගෘහපතියන්ට ආරක්ෂාව සැලසීම ලෙස පෙන්වා දෙන්නේ ද ඔවුන්ගේ ජීවනෝපාය සිදු කර ගෙන යාම සඳහා රාජ්‍ය මැදිහත්වීමක් සිදු කිරිමෙන්, රාජ්‍ය තන්ත්‍රයේ යුතුකම වන්නේ ඔවුනට අවශ්‍ය බිත්තර වී හා අවශ්‍ය උපකරණ සපයා දීමය. විශේෂයෙන් අවධාරණය කළ යුත්තේ රාජ්‍යය තුළ සිටින දිළින්දන්, ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමට අවශ්‍ය උපකරණ හා පුහුණුව ලබා දීමය. ධනය දීම ලෙස පෙන්වා දෙන්නේ, ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමය. ජනතාව ආර්ථික වශයෙන් සවි බල ගැන්වීම රජයේ යුතුකම වන අතර එහිදි අයිතිවාසිකම් හිමිවීම වශයෙන් දැක්විය හැක්කේ රටේ ආර්ථික තත්ත්වය ස්ථාවරත්වයට පත් කිරීමයි.

සිල්වත්, ගුණවත් පැවිදි උතුමන්ට සිව්පසයෙන් සංග්‍රහ කොට, දැහැමි රැකවරණය සලසා දීම ද පාලකයාගේ යුතුකම බව පෙන්වා දෙයි. සිව්පා සතුන්ගේ ද ජිවිත ආරක්ෂාව සැලසීම රජුගේ යුතුකම වේ. (ධර්මසිරි, බෞද්ධ සදාචාරයේ මූලධර්ම, 98 පිටුව) සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගිම ද රජුගේ වගකීම වේ. පැවිදි උතුමන් ආරක්ෂා කිරීම තුළ නිරායාසයෙන්ම රට සදාචාරවත්වේ පාලිතයන්ට අවශ්‍ය සුභසාධනය සැපයීම රජුගේ යුතුකම වේ. මේ ආකාරයෙන් පාලකයා විසින් පාලිතයා කෙරෙහි යුතුකම් ඉටු කරන්නේ නම්, පාලිතයා විෂයයෙහි ලැබිය යුතු අයිතිවාසිකම් සියල්ල හිමි වන අතර ඔවුන් සතුටට පත් ව, ඔවුනොවුන් විසින් ද තමාගෙන් තුළින් ඉටු විය යුතු සියලු යුතුකම් පාලකයා කෙරෙහි ඉටු කරනු ලැබේ. එමඟින් පාලකයා හා පාලන තන්ත්‍රය කෙරෙහි ගැටලු සහගත තත්ත්වයන් උද්ගත නොවන අතර සාමකාමී මෙන්ම ධර්මිෂ්ඨ රාජ්‍යයක් ද ගොඩනැගෙනු ඇත.

යුතුකම් ඉටු කිරිමේ දී දේශපාලනික වශයෙන් යුතුකම් ඉටු කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වේ. ඒ මත සියලු අංශයන් පදනම් වන අතර නිසි ලෙස යුතුකම් ඉටු කරන්නේ නම් රාජ්‍ය තුළම සාමකාමී හා සුවදායී පරිසරයක් නිර්මාණය වනු ඇත. ඒ අනුව අයිතිවාසිකම් හිමි ව සිටින පුද්ගලයා සමාජය කෙරෙහි රාජ්‍ය කෙරෙහි තම යුතුකම් ඉටු කරනු ලබයි. දස රාජ ධර්මයේ

දී දානං සීලං පරිච්චාගං අජ්ජවන් මජ්ජවන් තපං අක්කෝධෝ අවිහිංසංච ඛන්තීච අවිරෝධතා වශයෙන් දක්වන්නේ දානය, ශීලය, පරිත්‍යාගය, සෘජු බව, මෘදු බව, අවිහිංසාව, අක්‍රෝධය යන්නයි. (ජාතක පාලිය, 2008, 352 පි)

රජු කෙරෙහි තිබිය යුතු ගුණාංගයක් වශයෙන් දක්වන්නේ දානය, පරිත්‍යාගශලීත්වය යි. නොඑසේනම් රට වැසියා කෙරෙහි යුතුකම් ඉටු කිරිමට, ඔවුනට අවශ්‍ය ආරක්ෂාව සමාජ සුභසාධනය සපුරාලීම කළ නොහැකිවේ. රජු සිල්වත් නොවන කල්හි රට වැසියා ද අධාර්මික වේ. රජුගේ ධාර්මිකත්වය, සිල්වත්භාවය පදනම් කර ගනිමින් පාලනය, ආර්ථිකය, සමාජ තත්ත්වය තීරණය වේ.

පාලනය සිදු කිරිමේ දී සෘජු බව තිබිය යුතුය. පාලකයා විසින් තීරණ ගැනිමේ දී සෘජුව තීරණ ගැනීමට මෙන්ම ඇතැම් අවස්ථාවල දී මෘදු බව ද තිබිය යුතු වේ. නොඑසේ නම් පාලකයා කෙරෙහි ඇති විශ්වසනීයත්වය නොමැති වීමෙන් නිවරදි යාන්ත්‍රණයෙන් යුක්ත රටක් දැකිය නොහැකිය. ඉවසීමෙන් යුක්තව තීරණ ගැනීමෙන් බොහෝ පිරිසකට සාධාරණය මෙන්ම මානසික සුවතාවය ද හිමිවේ. පාලකයන්ගේ යුතුකම වන්නේ ඡන්ද, ද්වේශ, භය, මෝහ යන සතර අගතියෙන් යුක්ත නොවීමයි. පාලකයා සතර අගතියෙන් යුක්ත වූ විට සිදු වන්නේ අපක්ෂපාතී ව සියලු දෙනාටම පොදු සාධාරණ වූ තීරණයකට එළඹීමට නොහැකි වීමයි. පාලකයා කෙරෙහි ඇති විශ්වසනීයත්වය සතර සංග්‍රහ වස්තු ද පාලකයා විසින් ප්‍රගුණ කළ යුතු බව අවධාරණය කරයි.

පාලකයා තම පාලිතයා කෙරෙහි නිසියාකාරව යුතුකම් ඉටු කරන්නේ නම් පාලිතයාගේ අයිතිවාසිකම් ඉටුවේ. එවිට පාලිතයා විසින් යුතුකම් ඉටු කරන විට, පාලකයාගේ අයිතිවාසිකම් ඉටුවේ. පාලිතයා විසින් යුතුකම් ඉටු කරන විට, පාලකයාගේ අයිතිවාසිකම් ඉටු වීම තුළ යහපත් පාලන තන්ත්‍රයක් ගොඩනැගේ.

## ආර්ථික යුතුකම් හා අයිතිවාසිකම්

බුදුදහම තුළ යුතුකම් ඉටු කිරිමේ දී ආර්ථික අංශය ද ස්ථාවර විය යුතුය. ආර්ථික වශයෙන් පුද්ගලයා හා සමාජය ස්ථාවරවීම තුළ අයිතිවාසිකම් ආරක්ෂාවේ. නිසි ආර්ථික කළමනාකරණයක් නොවූ විට පමණක් ආර්ථික අස්ථාවරත්වයක් ඇති වන අතර ඉපයීම, පරිභෝජනය යන අංශයන් අධාර්මිකව සිදු කිරීම හා නිසි කළමනාකරණයක් නොමැතිවීම මත ගැටලු උද්ගතවේ. සබඳතා ආරක්ෂා කර ගැනීම උදෙසා ආර්ථිකය විශාල වශයෙන් බලපෑම් කරයි. යුතුකම් ඉටු කිරිමේ දී ධනය ප්‍රධාන සාධකයක් වන අතර ධනය ආරක්ෂා කර ගැනීම ද පුද්ගලයාගේ යුතුකම වේ. ආර්ථික ස්ථාවරභාවය ලඟා කර ගැනිමේ දී පුද්ගලයාගේ යුතුකම වන්නේ ධාර්මිකව ඉපයීමයි. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් වන ආකාරයට මෙලොව දියුණුව සඳහා හේතු වන කරුණු 04කි.

උට්ඨාන සම්පදා

ආරක්ඛ සම්පදා

සමජිවිකතා

කල්‍යාණමිත්තතා (අංගුත්තර නිකාය, 2008, 236 පි) යනුවෙනි.

ආර්ථික වශයෙන් යුතුකම් ඉටු කිරිමේ දී ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී දීඝජානු කෝලිය පුත්‍රයන්ට දේශනා කළ පරිදි මෙලොව ජිවිතයේ දියුණුවට හේතු වන කරුණු වශයෙන් එහිදි උට්ඨාන විරියාධිගතෙහි, බහා බල පරිච්තෙ හි, සෙදාවක්ඛිත්තෙහි, ධම්මිකෙ ධම්ම ලද්දෙහි. (අංගුත්තර නිකාය, 2008, 236 පි) උත්සාහයෙන්, දැතේ වීර්යයෙන්, දහදිය වගුරුවා, ධාර්මිකව ඉපයිය යුතුය. පුද්ගලයාගේ වගකීම වන්නේ උපයන ධනය ආරක්ෂා කර ගැනීමය. ධනය ගින්නෙන්, ජලයෙන්, රජයෙන්, සොරුන්ගෙ න් හා අප්‍රිය ඥාතීන්ගෙන් රැක ගනියි. එහිදි ස්ත්‍රී ධූර්තවීම, සුරා ධූර්තවීම, සුදුව යන කාරණාවන්ගෙන් පුද්ගලයා පිරිහෙන බවය. (අංගුත්තර නිකාය, 2008, 238 පි) මෙහිදි විශේෂයෙන් අවධානය

යොමු කළ යුත්තේ අය වැය සමව දැන පරිභණය කිරීමයි. තමා උපයන ධනයේ ප්‍රමාණය අනුව තම අවශ්‍යතා ලඝු කර ගැනීමයි.

ආර්ථික වශයෙන් යුතුකම් ඉටු කිරීමේ දී ධනය ඉපයීම පරිභෝජනය හා ඉතිරිය යන අංශයන් කෙරේ අවධානය යොමු කළ යුතුවේ. ධනය ඉපයිමේ දී ධාර්මිකව ඉපයිය යුතු රැකියාවන්හි නිරත විය යුතු අතර නොකළ යුතු රැකියාවන් ලෙස මස් වෙළදාම, මාංශ වෙළඳාම, අවි ආයුධ වෙළඳාම, වහල් වෙළඳාම, වස විස වෙළදාම වශයෙනි (හෙට්ටිආරච්චි, බෞද්ධ ආර්ථික දර්ශනය 301 පිටුව). ඒවායෙහි නිරත නොවීම තුළ සමාජය සදාචාර සම්පන්න වේ. මිච්ඡා ආජීවයෙන් තොර වීම, කුහනා, ලපනා, නෙමිත්තිකතා නිප්පෙසිකතා හා ලාභයෙන් ලාභය සොයා යාම මුලු මහත් සමාජයටම එයින් සාධාරණයක් වන අතර සදාචාර විරෝධි වීම තුළ බොහෝ දෙනෙකුගේ අයිතිවාසිකම් අහිමිවීම දක්නට ලැබේ.

අයිතිවාසිකම් අහිමිවිම තුළ පුද්ගලයා අතෘප්තියට හා අසහනයට පත්වේ. වෙළඳාම් කිරිමේ දී සිදු කරන වංචනික ක්‍රියාවන් හේතුවෙන් බොහෝ දෙනෙකුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වේ. (තුලාකූට කංසකූට මානකූට පටිවිරතො හොති උක්කොටන වඤ්චන නිකතිසාචියොගො පටිවිරතො හොති ඡෙදනවධබන්ධන විපරාසමොස අලොපසහසාකාරා පටිවිරතො හොති.) හොර තරාදියෙන් කිරුමෙන්, බොරු රන් පෑමෙන්, හොර මිනුම් වලින් මිනුමෙන්, වැළැක්කේ වෙයි. අල්ලස් ගෙන හිමියන් නොහිමියන් කිරීමෙන්, නා නා උපායෙන් අනුන් රැවටීමෙන් අගනා දැයට හුරු නොගනා දෙයක් පෙන්වා කරන මායාවෙන් (නිකතිසාචියොගා) සෑම කෛරාටිකකම් වලින් වැළැක්වේ. අත් පා සිදීමෙන්, මැරිමෙන් රැහැන් ආදියෙන් බැදිමෙන් සැහැසිකම් වලින් වැළැක්විමෙන් කටයුතු කරන ලදි, (හෙට්ටිආරච්චි, බෞද්ධ ආර්ථික දර්ශනය 343 පිටුව).

ආර්ය ශ්‍රාවකයා දැහැමින් ලද ධනයෙන් තමා සුවපත් වෙයි, පිණවයි.( අත්තානං සුඛෙති, පීණෙති) ධනය මනාවට සැපසේ පරිහරණය කරයි. තමා උපයන ධනය කොටස් හතරකට බෙදා

එයින් එක් කොටසක් පරිභෝජනය සඳහා ද කොටස් දෙකක් ආයෝජනය සඳහා ද අනෙක් කොටස ආපදාවක දී ප්‍රයෝජන ගැනීම සඳහා තැන්පත් කළ යුතු බව දැක්වේ. (ඒකෙන භොගෙ භුඤ්ජෙය්‍ය ද්විහි කම්මං පයොජයෙ චතුත්ථංච නිධාපෙය්‍ය ආපදාසු භවිස්සති) එසේම තමා උපයන ධනයෙන් ඥාතීන්, ආගන්තුකයන්, මිය ගිය ඥාතීන්, රජය වෙනුවෙන් අය විය යුතු අයබදු සහ ආගමික කාර්යයන් සඳහා යොදවයි. ඤාති බලි, අතිථි බලි, පුබ්බපේත බලි, රාජ බලි, දේවතා බලි රාසිය සූත්‍රයේ හා පත්තකම්ම සූත්‍රයේ සඳහන් වන ආකාරයට, තමා භෝගයන් ප්‍රයෝජනයට ගනී. පරිභෝජනය හා හෙවත් භුඤ්ජනය යන්නෙහි උපභුඤ්ජනය හා උපයුඤ්ජනය යන අර්ථ දෙකක් පවතී. උපභුඤ්ජනය යනු පෞද්ගලික පරිභෝජනයයි. උපයුඤ්ජනය යනු මහණ බමුණන්ට, දුගීමගී යාචකයන්ට දාන වශයෙනුත් තමන් අදහන දෙවිදේවතා ආදීන්ට බලි වශයෙනුත් පරලොව ගියවුන් උදෙසා මතකදාන වශයෙනුත් පරලොව ගියවුන් උදෙසා මතකදාන වශයෙනුත් සේවකයන්ට වේතන වශයෙනුත් ධනය යෙදවීමයි. (පද්මසිරි, හේවාමානගේ, ප්‍රියදර්ශන, බෞද්ධ චින්තනය සහ සංස්කෘතිය සම්මානිත මහාචාර්ය සුමනපාල ගල්මන්ගොඩ සුලේඛා , 221 පිටුව)

ධනය ඉතිරි කිරිමේ දී මලෙන් රොන් ගන්නා බමරකු මෙන් අනුන්ට පීඩාවක් නොකර ධනය රැස් කරන්නා වූ පුද්ගලයාගේ සම්පත් දියුණුවට පැමිණේ. කුමක් මෙන් ද ක්‍රමයෙන් වේයන් විසින් බඳිනු ලබන්නා වූ තුඹස වැඩෙන්නාක් මෙනි ධනය ඉතිරි කළ යුතුය. (විජේබණ්ඩාර, මොරටුවගම, බෞද්ධ දර්ශනය සහ සංස්කෘතිය, 256 පිටුව) එහිදි (භොගෙ සංහාරමානස්ස, භමරස්සෙව ඉරීයතො - භොගා සන්නිචයං යන්ති වම්මිකො වූප චීයති). කුල සූත්‍රයේ දී සඳහන් වන ආර්ථික සමෘද්ධිය කෙරෙහි හේතු වන කරුණු හතරකි. එහිදි ද අවධාරණය කරනු ලබන්නේ, පුද්ගලයා විසින් නට ද සොයත්, දිරූ දෑ පිළිසකර කරත්, පරිමිත ආහාරපාන පරිභෝජනය කරයි. සිල්වත් ස්ත්‍රියක හෝ පුරුෂයෙකු අධිපති බවෙහි තබයි. මේ ආකාරයෙන් දනය පරිභෝජනය කළ යුතු ආකාරය කෙරෙහි පිළිපදින්නේ නම් භෝග මහත්වයට පැමිණෙන බවයි.

දිළිඳු බව දුකක් කියන ඉණ සූත්‍රය ණය ගැනීම, ඊට පොළී ගෙවීම, ණය නිසා චෝදනා ලැබීම, ණය නොගෙවීම නිසා තමා ලුහුබැඳීම, ණය හේතුවෙන් දඬුවම් ලැබීමත් දුකක් බව පෙන්වා දෙයි.

සාමඤ්ඤඵල සූත්‍රයේ දී ණය වී සිටි මිනිසෙකු සියලු ණය ගෙවා දමා ඉතිරි කර ගත් දැයින් සිය අඹු දරුවන් පෝෂණය කිරීම ශ්‍රමණ ඵලයට උපමා කර ඇත. මේ තුළින් ගම්‍යමාන වන්නේ යුතුකම් ඉටු නොකිරීම හේතුවෙන් දුකට පත් වන ආකාරයත් නින්දාවන් අපකීර්තිය ලැබෙන ආකාරයයි ණය ලබා ගන්නේ නම් නිසි පරිදි නැවත ගෙවීම තම යුතුකම වේ එසේ නොවේ නම් විවිධ අර්බුදකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවේ ණය නොවී සිටීම ශ්‍රමණ ඵලයට උපමා කර ඇත්තේ නිවීමක් සහනයක් සුවයක් ගැටුම් ඇති නොවීම තුළ පවතින නිසාවෙනි. එමෙන්ම බුදු දහම තුළ පුද්ගලයා සැපයෙන් යුක්තව කටයුතු කරන්නේ නම් පුද්ගලයාට අත්විඳිය යුතු සැප වර්ග හතරක් පිළිබඳ සඳහන්වේ. ආර්ථික ස්ථාවරභවය ඇති කර ගැනිමෙන් අත්විඳිය හැකි සැපයන් ලෙස අණන සූත්‍රය, අත්ථි සුඛ, භෝග සුඛ, අනවජ්ජ සුඛ පෙන්වා දේ. යුතුකම් ඉටු කිරිමෙන් හා අයිතිවාසිකම් හිමිවීම මත සහජීවනයෙන් යුතු සමාජ සංස්ථාවන් ගොඩනැගෙනු ඇත.

## නිගමනය

යුතුකම් හා අයිතිවාසිකම් එකම කාසියක දෙපැත්තක් ලෙස හඳුන්වා ඇත. බෞද්ධ විග්‍රහය තුළ පෙන්වා දෙන්නේ යුතුකම් ඉටු කිරීම මඟින් අප වටා ඇති සමාජ සංස්ථාවන්හි අයිතිවාසිකම් නිතැතින්ම ඉටු වන ආකාරයයි. අප විසින් යුතුකම් ඉටු නොකිරීම තුළ අනෙකාගේ අයිවාසිකම් ඉටු වීම හා ඉටු නොවීම තීරණාත්මක සාධකයක් වේ. ඒ තුළින් ගම්‍යමාන වන්නේ යුතුකම් ඉටු කිරීම තුළින් අනෙකාගේ සුබසෙත උදා වීමත් අනෙකා විසින් යුතුකම් ඉටු කිරීම තුළ තමාගේ අයිතිවාසිකම් හිමි වීමත් සිඳු වන බවයි. අධ්‍යතන සමාජය තුළ බොහෝ අර්බුදකාරී තත්ත්වයන් උද්ගතවීමට හේතු සාධක වන්නේ තමා විසින් යුතුකම්

ඉටු නොකොට අනෙකාගෙන් අයිතිවාසිකම් දිනා ගැනීමට අර්බුද නිර්මාණය කිරීමයි තම තමන් විසින් ආර්ථික, සමාජයීය, දේශපාලනික වශයෙන් සියලුදෙනා විසින් ම තම යුතුකම් නිසි ලෙස ඉටු කරන්නේ නම් සියලු දෙනාගේම අයිතිවාසිකම් හිමි වීම පදනම් කරමින් අර්බුද නිර්මාණය වීම අවම වනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

*අංගුත්තර නිකාය*, (2008). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*දීඝනිකාය*, (2008). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ජාතකපාළි*, (2008). බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

### ද්විතීය මූලාශ්‍රය

ගුණපාල, ධර්මසිරි, (1988). *බෞද්ධ සදාචාරයේ මූලධර්ම*. රත්මලානඃ සර්වෝදය ග්‍රන්ථ ප්‍රකාශන සේවය.

ධර්මසේන, හෙට්ටිආරච්චි. (2002). *බෞද්ධ ආර්ථික දර්ශනය*. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

චන්දිම, විජේබණ්ඩාර, එච්. එම්. මොරටුවගම, (2010). *බෞද්ධ දර්ශනය සහ සංස්කෘතිය*. කොළඹ 10ඃ සමයවර්ධන පොත්හල (පෞද්ගලික) සමාගම.

### සංස්කරණය

මහාචාර්ය *ඔලිවර් අබේනායක බෞද්ධ අධ්‍යයන විමර්ශනය*, සංස්ඃ මහමිතව පඤ්ඤාරතන හිමි, පහලගම ධම්මික හිමි, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, පුංචි බොරැල්ල, 2009.

*බෞද්ධ චින්තනය සහ සංස්කෘතිය සම්මානිත මහාචාර්ය සුමනපාල ගල්මන්ගොඩ සුලේඛා*, රලුවේ පද්මසිරි, විමල් හේවාමානගේ, වසන්ත ප්‍රියදර්ශන, සිල්වර් ලීෆ් ප්‍රකාශකයෝ, පිළියන්දල, 2024.

සම්භාෂා වලස්මුල්ලේ, ඤාණරතන හිමි, සංස් අධ්‍යාපන අමාත්‍යංශයේ පිරිවෙන් ශාඛාවේ ප්‍රකාශනයකි. 2011, 2012.

### ශබ්ද කෝෂ

*Oxford Advanced Learner's Dictionary*, Edi- Sally Wehmeier, Oxford University Press, 2005.